මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අහිතකර මතය

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විතම හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයනලදී.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුවප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.32 ඡේදය හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සඳහා ගැලපීම් ලෙස දක්වා තිබුණු රු.151,336,564 ක් වූ වටිනාකම කුමක්ද යන්න විගණනයට අනාවරණය නොවූ අතර සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායමට ගලපා තිබූ ක්ෂය රු.27,813,114 ක් රු.29,602,865 ක් ලෙස රු.1,789,751 ක් වැඩියෙන් වර්ෂයේ අතිරික්තයට ගලපා තිබුණි. තවද විස්තීර්ණ ආදායමට ගලපනලද පොලී ආදායම රු.58,230,157 ක් අතිරික්තයෙන් අඩුකිරීමත් විස්තීර්ණ ආදායමට ගලපන ලද වත්කම් විකිණීම මත පාඩු රු.11,909 ක් අතිරික්තයට එකතුකිරීමත් දක්වා නොතිබුණි. විස්තීර්ණ ආදායමට ගලපන ලද රු.399,747 ක් වූ ණයපොලී වියදම අතිරික්තයට එකතුකර දක්වා නොතිබූ අතර රු.2,884,652 ක තොග වටිනාකම වැඩිවීම රු.2,868,643 ක් ලෙස ගැලපුම් කර තිබුණි. තවද ගෙවිය යුතු දෑ වල අඩුවීම රු.103,807,221 ක් වෙනුවට රු.98,815,962 ක් ලෙස දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායමට ගලපන ලද මෝටර්රථ ඉවත්කිරීමේ ලාභය රු.499,520 ක් අතිරික්තයට ගැලපුම් කර නොතිබුණි.	2025 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී නිවැරදි කරන බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.26 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.245,626,236	මුදල් හා මුදල් සමාන දෑ ඉදිරිපත් කර ඇති බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ

	ක මුදල් හා මුදල් සමාන දෑ රු.245,647,232 ක් ලෙස දක්වා තිබුණි.		පිළියෙල කළ යුතුය.
(ඈ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.29 ඡේදය හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.3 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂය තුලදී ආයෝජන නිදහස්කිරීම් රු.229,032,632 ක් හා නව ආයෝජන රු.235,167,691 ක් මුදල් ගලාඒම් සහ මුදල් ගලායාම් ලෙස වෙන වෙනම දැක්විය යුතු වුවත් ආයෝජන මුදල් ගලාඒම් ලෙස රු.66,801,527 ක් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදී ස්ථාවර තැන්පතු පොලී ආදායම් ලෙස මුදලින් ලැබී තිබූ රු.51,274,355 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.	ආයෝජන වෙනස් වීම් සටහන් කිරිම ප්‍රමාණවත්බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.30 ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2 හි පහදාදීම් හා මගපෙන්වීම් හි EG 6.4 ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී, සමාලෝචිත වර්ෂය තුලදී මුදලින් ගෙවා තිබූ රු.399,747 ක මූල්‍ය පොලී දක්වා නොතිබුණි.	2025 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී නිවැරදි කරන බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.
(ඉ)	ප්‍රමිතියේ පරිශිෂ්ඨය 2 හි පහදාදිම් හා මගපෙන්වීම් හිEG 2.7 ප්‍රකාරව 2023 වර්ෂයේදී ඉඩම් පරිත්‍යාග ලෙස ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙහි වූ රු.1,100,000 ක වටිනාකම විස්තීර්ණ ආදායමට හඳුනාගැනීම සඳහා තාර්කික වූ ප්‍රතිශතයක් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවත් එම ප්‍රතිපත්තිය අනාවරණය කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී ප්‍රතිපත්තියක් සකස් කරන බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.
(ඊ)	ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදය හා විස්තරාත්මක පහදාදීම් හි EG 3.2 ඡේදයට හා ප්‍රමිතියේ 18 වන පරිච්ඡේදය 18.9 ඡේදයට පටහැනිව දෙවලපොල උපකාර්යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් ප්‍රත්‍යාගණනය කිරීමේදී එකම ගොඩනැගිල්ල කොටස් වශයෙන් නිමකිරීම් හා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා විවිධ අවස්ථාවලදී භාණ්ඩ මිලදී ගැනීම් සඳහා වූ වෙන වෙනම දක්වා තිබූ පිරිවැයන් සඳහා වටිනාකම් ආදේශ කිරීමක් සිදුකර තිබුණි. එලෙස ගොඩනැගිලි 30 ක වටිනාකම් ප්‍රත්‍යාගණනය කිරීමේදී අවස්ථා 98 කදී ඒ සඳහා වැය කරනලද පිරිවැය රු.40,230,636 ක් වුවද රු.42,677,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණි. මෙම ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය විගණනයේදී පිළිගත නොහැකිවිය.	2025 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී නිවැරදි කරන බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.

(උ)	ප්‍රමිතියේ 10 වන පරිච්ඡේදයේ 10.8 ඡේදයට හා 10.10 ඡේදයට පටහැනිව සභාව විසින් භාණ්ඩ මිලදීගැනීමට ඇණවුමක් ද රහිතව 2025 වර්ෂයේ ඉටුකිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සඳහා , භාණ්ඩ මිලදීගැනීමට රු.86,497,598ක ණයගිම් වෙන්කිරීමක් සිදුකර මාර්ග යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. එමනිසා එම ප්‍රමාණයෙන් මාර්ග අධිතක්සේරු වී තිබුණි.	සංවර්ධන ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු බිල්පත් බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.
(ඌ)	ප්‍රමිතියේ 18 වන පරිච්ඡේදයේ 18.9 ඡේදය ප්‍රකාරව සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබූ වත්කම් පන්ති 5 හි අයිතම් වල වෙළඳපොල අගය හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.
(එ)	ප්‍රමිතියේ 18 පරිච්ඡේදයේ 18.10 ඡේදය ප්‍රකාරව වත්කම් පන්ති 7 ක් ප්‍රත්‍යාගණනය කිරීමේදී හඳුනාගත් ප්‍රතිලාභය රු.147,017,294 ක් අතිරික්තයට ගලපනු වෙනුවට, වත්කම් පන්තිවලින් සම්පූර්ණ වටිනාකම් ඉවත්කිරීම් රු.108,512,119 ක් සමුච්චිත අරමුදලට හර කර , නැවත ප්‍රත්‍යාගණනය කළ වටිනාකම වූ රු.38,505,175 ක් සංචිත හා වෙන්කිරීම් ගිණුමට ගැලපුම්කර තිබුණි. ඒ අනුව වත්කමේ පවතින ශේෂය එක් ගිණුමකින්ද , නැවත වත්කම් ලබාදීම තවත් ගිණුමකින්ද ලෙස ගිණුම් දෙකක් මඟින් ගැලපීම් කර තිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළදී මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පතු ආදායමට ගැනීමක් සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායමක් ලෙස දැක්විය යුතු වුවද රු.681,324 ක් සමුච්චිත අරමුදලට ගලපා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අඩුවෙන් දැක්වේ.	මෙම වර්ෂයේ ආදායමට ගත නොහැකි බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ආ)	රජයේ ආධාර මුදල් ගිණුමෙහි 2023 වර්ෂයේ සටහන්කර තිබූ රු.5,000,000 ක පුනරාවර්තන ප්‍රදාන සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට ගලපා තිබුණි. එම නිසා ප්‍රාග්ධන ප්‍රදාන එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරියේ දී නිවැරදි කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.

(ඇ)	ණයහිමි ශේෂය තුල වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 05 කට අදාල රු.4,599,390 ක් හා ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති 02 කට අදාල රු.3,655,122 ක එකතුව වූ රු.8,254,512 ක් ප්‍රාග්ධනිත කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඈ)	දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘති හා විමධ්‍යගත ව්‍යාපෘති යටතේ ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති 10 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.12,783,127 කට අදාලව ගොඩනැගිලි නිමකිරීම් හා ඉදිකරමින් පවතින ගොඩනැගිලි වෙන් වෙන්ව හඳුනාගෙන ප්‍රාග්ධනිත කළයුතු වුවත් එසේ කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඉ)	පළාත් නඩත්තු ක්‍රියාකාරී සැලැස්ම හා බස්නාහිර පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 03 ක් සඳහා ලැබී තිබුණු රු.4,470,627ක පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදාන ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස දැක්විය යුතු වුවත් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි.	2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.37,956,474 ක් වියයුතු වුවත් , විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ එය රු.58,230,157 ක් ලෙස රු.20,273,683 ක් වැඩියෙන් දක්වා තිබුණි.	පරීක්ෂා කර තොරතුරු පසුව ඉදිරිපත් කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(උ)	2021 වර්ෂයේ සිට පත්තඩුවන උප කාර්යාලයේ ඉඩම් කට්ටිකර විකිණීමෙන් සභාවට ලැබී තිබුණු පොදු ඉඩම් දෙකකට අදාල එකතුව රු.11,532,500 ක වටිනාකමක් සමාලෝචිත වර්ෂයේදී ද ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඌ)	ඉඩම් උපලේඛනයේ හා ලෙජර් ගිණුම්වල වූ රු.13,050,000 ක් වූ නොසැසඳුණු වෙනසට හේතු අනාවරණය කරගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ඉඩම් විකුණුමෙන් අඩුකර සමුච්චිත අරමුදලට හර කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(එ)	සමාලෝචිත වර්ෂය සඳහා පරිගණක ක්ෂය වටිනාකම රු.715,859 ක් විය යුතු වුවද, රු.199,063 ක් ලෙස රු.516,796 ක් අඩුවෙන් දැක්වීම නිසා අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි.	පරීක්ෂා කර තොරතුරු පසුව ඉදිරිපත් කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඒ)	2023 වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි ආදායම් හා වියදම් ගැලපීමෙන් වූ නිවැරදි අතිරික්තය රු.181,645,647 ක් වියයුතු වුවත් රු.30,650,742 ක් වූ සාවද්‍ය වටිනාකම ක් සමාලෝචිත වර්ෂයේ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයට ගලපා තිබුණු හෙයින් හේතු අනාවරණය නොකළ වෙනස රු.150,994,905 ක් විය.	පරීක්ෂා කර තොරතුරු පසුව ඉදිරිපත් කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.

(ඔ)	සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන්කිරීමක් සිදුකර නොතිබුණු අතර 2023 වර්ෂය සඳහා ගෙවනලද රු.536,721 ක් වූ වටිනාකම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි.	2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඕ)	නිමකරන ලද මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 03 ක් යටතේ දක්වා තිබූ එකතුව රු.3,172,905 ක් අතරින් රු.2,646,099 ක් මාර්ග, පාලම්, බෝක්කු ලෙස ද රු.526,804 ක් ගොඩනැගිලි ලෙසද ප්‍රාග්ධනිත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි.	2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ක)	ව්‍යාපෘති 7 ක් යටතේ නිමකරන ලද වටිනාකම රු.7,179,246 ක් වූ ගොඩනැගිලි, මාර්ග යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.	2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ග)	2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදි පෙන්වාදුන් ගිණුම්කරණ අඩුපාඩුවලින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉඩම් වෙන්දේසියෙන් ලද පොදු බිම් කොටස් දෙක ප්‍රාග්ධනිත කිරීමේදී රු.1,100,000 ක් වූ අවම මිලකට ප්‍රාග්ධනිත කර තිබීමෙන් රු.15,810,000 ක් ඉඩම් වටිනාකම අඩුවෙන් දක්වා තිබීම නිවැරදි කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ච)	2023 වර්ෂයේදී මින් මැදුර අළුත්වැඩියාව සඳහා වැයකරන ලද රු.291,062 ක් වියදමක් ලෙස නොදක්වා , සමාලෝචිත වර්ෂයේදි රු.270,000 කට ප්‍රත්‍යාගණනය කර සවිකිරීම් යටතේ දක්වා තිබීමෙන් ජංගම නොවන වත්කම් රු.270,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ජ)	දෙවලපල උපකාර්යාලයේ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමේදී රු.1,411,410 ක අළුත්වැඩියා පිරිවැයක් රු.1,718,000 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර තිබුණෙන් ගොඩනැගිලි වටිනාකම රු.306,590 කින් වැඩියෙන් දක්වා තිබූ අතර ගොඩනැගිලි යටතේ රු.2,100,000 ක ඉඩම් ද රු.2,875,000 ක මාර්ග පාලම් හා බෝක්කු ද ප්‍රාග්ධනිත කර තිබුණි.	2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ට)	ගොඩනැගිලි තුල ඉඩම් හා මාර්ග පාලම් බෝක්කු වටිනාකම් ඇතුලත් වීම හේතුවෙන් රු.137,484 ක් වර්ෂයේ ක්ෂය අඩුවෙන්ද රු.163,125 ක් සමුච්චිත අරමුදල අඩුවෙන් ද රු.245,641 ක් ගොඩනැගිලි සමුච්චිත ක්ෂය වැඩියෙන්ද දක්වා තිබුණි.	2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.

1.6.3 නොසැසඳුණු පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ගිණුම් ශේෂ 02 ක් හා ඒවාට අදාළ උපලේඛනවල එකතුන් අතර රු.11,839,138 ක් වූ නොසැසඳුණු වෙනසක් පැවතුණි.	පරීක්ෂාකර බලා පසුව තොරතුරු ඉදිරිපත් කරන බව.	වෙනසට හේතු සොයා නිවැරදි කරගත යුතුය

1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනත VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය	මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී සමාලෝචන වාර්තාව සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව.	යොමුගත පනතට අනුව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571	වටිනාකම රු. 7,342,029 ක් වූ වර්ෂ දෙක ඉක්මවූ ඉකුත් තැන්පතු නියාදනය කර නොතිබුණි.	තැන්පත් මුදල් ආදායමට ගැනීමට කටයුතු කරන බව.	යොමුගත රෙගුලාසියට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඇ)	2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය			
I	3.4.1(ආ)	2024 ජුනි 25 දිනැති තාක්ෂණික ඇගයීම් වාර්තාව අනුව එකතු ඇස්තමේන්තු වටිනාකම රු.87,598,520 ක් වූ ව්‍යාපෘති 65 හි පූර්ව සැලසුම්ගත රටාවකට තරහකාරී මිල ගණන් නොලැබෙන පරිදි ලංසුකරුවන්ට එක් එක් ව්‍යාපෘතියට එක් කොන්ත්‍රාත්කරුවෙකු බැගින් පමණක් ඉදිරිපත් වී ප්‍රසම්පාදන මූලධර්ම කඩවී තිබියදී එම එක් එක්	ඉදිරියේ දී ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන බව.	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය.

		කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. 2024 අගෝස්තු 08 දින හා 2024 ජුනි 13 දින පිළිවෙලින් මිලගණන් කැඳවන ලද ව්‍යාපෘති 36 ක් සහ 37 ක්ද ඉහත පරිදි පිරිනමා තිබුණි.		
II	2.3.2(ආ) (ඇ) , 2.4.1 සහ 2.11.1(අ)	උඩුගම්පල මහජන පුස්තකාලයට රු.1,107,300 ක ලී බඩු මිලදී ගැනීමේදී මෙම මාර්ගෝපදේශ අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේ දී ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන බව.	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	2020 අගෝස්තු 24 දිනැති අංක LGD/09/2019(I) දරන පළාත් පාලන චක්‍රලේඛය	රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුමෙහි ආකෘති ප්‍රකාරව සේවක ණය සම්බන්ධව වාර්ෂිකව ණය සීමා අනුමත කරගෙන නොතිබුණි.	2024 අය වැය ලේඛනය මගින් වාර්ෂික ණය සීමා අනුමත කර ඇති අතර ගිණුමට ඉදිරිපත් කර නොමැති අත්තිකාරම් බී ගිණුම ට අදාල සේවක ණය සැසඳුම් ප්‍රකාශය ඉදිරිපත් කර ඇති බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායමරු.123,310,520 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.30,650,742ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.000'	රු.000'	රු.000'	රු.000'	රු.000'	රු.000'	රු.000'	රු.000'
(i)	වරිපනම් හා බදු	29,602	32,116	29,249	41,563	34,137	37,083	27,210	39,430
(ii)	කුලී	2,618	2,551	2,987	31	1595,	1633,	2,068	411
(iii)	බලපත්‍ර ගාස්තු	1,100	3,428	3,362	67	965	2,466	2,466	-
(iv)	වෙනත් ආදායම්	552	498	491	120	642	537	467	115
		33,872	38,593	36,089	41,781	37,339	41,719	32,211	39,956

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු බිල්කළ ආදායම, ඇස්තමේන්තුගත ආදායමට වඩා රු.මිලියන 2,514 ක් එනම් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 8 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 41,563 ක වරිපනම් හා බදු ශේෂයක් අයවිය යුතුව පැවතුණි.	ආදායම් රැස් කිරීමට උත්සාහ කරන බව.	හිඟ වරිපනම් ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රවනාගාරය සඳහා ගාස්තු අයකිරීම සඳහා සහ සුසාන භූමි සේවාව සැපයීම සඳහා ගාස්තු අය කිරීම වෙනුවෙන් 2024 වර්ෂයේදී ගාස්තු ගැසට්කර අයකර තිබූ නමුත් ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ගෙන නොතිබුණි.	අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමට කටයුතු කරමින් පවතින බව.	අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	මින් මැදුර වෙළඳ කුටි වෙනුවෙන් ගාස්තු අයකිරීම සඳහා ගාස්තු ගැසට්කර තිබුණද ඒ සඳහා ගාස්තු තීරණය කිරීම හා පරිපාලනය කිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පිළියෙල කර සම්මත කර නොතිබුණු හෙයින් ප්‍රාදේශීය සභා පනතේ 122(1) හා 126(vi) (ඇ) වගන්තිවලට පටහැනි වී තිබුණු අතර එම කුටි නියාමනය සම්බන්ධයෙන් සිදුකරන ක්‍රියාවලිය විගණනයට තහවුරු නොවීය.	අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමට කටයුතු කරමින් පවතින බව.	අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 ජනවාරි 27 දින අංක 2264/18 දරන ගැසට් නිවේදනය අනුව සභාව විසින් පරිසර බලපත්‍ර ලබාදිය යුතු ආයතන හඳුනාගැනීම සඳහා 2024 වර්ෂයට අදාලව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.	පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත්කිරීමට කටයුතු මේ වන විට සූදානම් කරමින් පවතින බව	ගැසට් පත්‍රය ප්‍රකාරව වාර්ෂිකව සමීක්ෂණයක් සිදුකළ යුතුය.

(ආ)	උඩුගම්පල ප්‍රධාන කාර්යාලය පිහිටි පර්චස් 103. 7 ක ඉඩම, පොල භූමිය සහිත පර්චස් 63.75 ක් වූ ඉඩම සහ පොදු වෙළඳපල පිහිටි පර්චස් 22.45 ක ඉඩම යන ඉඩම් තුනෙහි වටිනාකම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේදී ලේඛන ගත කිරීමට කටයුතු කරන බව	ප්‍රත්‍යාගණන වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	මාර්ග පළුදු කිරීම් වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අවස්ථා 24 කදී ලබාගත් රු.253,402 ක් හා 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පරිපාලන වියදම් ලෙස ලැබී තිබූ රු.952,378 ක් ආදායම් ලෙස හඳුනා නොගෙන තැන්පතු ලෙස රඳවාගෙන තිබුණි.	ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරන බව.	ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	2000 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ රු.811,727 ක අත්තිකාරම් ශේෂ 32 ක් නිරවුල් කර ගැනීමට කටයුතුකර නොතිබුණි.	පරීක්ෂා කර ඉදිරි කටයුතු කරන බව.	අත්තිකාරම් ශේෂ නිරවුල් කරගැනිමට කටයුතු කළ යුතුය.
(ඉ)	2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ව්‍යාපෘති 36 ක් සඳහා ලැබිය යුතු ලෙස දක්වා ඇති රු.1,223,202 ක ණයගැති ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාල මුදල ලබා ගැනීම සම්බන්ධව ඉල්ලීම් ලිපි කඩිනමින් යැවීමට කටයුතු කරන බව.	ණයගැති ශේෂ නිරවුල් කරගැනිමට කටයුතු කළ යුතුය.
(ඊ)	2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු.5,715,664 ක ණයහිමි ශේෂ නොගෙවා ඉදිරියට රැගෙනවිත් ඇති අතර, එම ශේෂ සත්‍ය ලෙසම ගෙවිය යුතු ද, ගෙවියයුතු නොවේ නම් තහවුරු කරගෙන කපා හැරීමටද කටයුතු කර නොතිබුණි.	එම ශේෂ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව.	ණයහිමි ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයේ ගබඩා අයිතම 5 කට අදාලව විස්තීර්ණ ආදායමට ගලපා තිබූ එකතුව රු.32,837,317 ක වියදම සත්‍ය ලෙසට වර්ෂයේ නිකුත් කිරීම්වල වියදමට සැසඳේද යන්න තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය.	භාවිතා කරන ලද තොග පිළිබඳ තොරතුරු තොග ලේඛනයේ සඳහන් කර ඇති බව.	නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂයේ පාරවල්, පාලම් ,බෝක්කු ගිණුමට රු.253,106,630 ක වටිනාකමක් ප්‍රාග්ධනිත කර තිබූ නමුත් රු.156,765,123 ක් වූ වටිනාකමට අදාලව ව්‍යාපෘති/ මාර්ග මොනවාද යන්නට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.	මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා වන වියදම් මාර්ගයෙන් මාර්ගයට වෙන් කර දැක්විය නොහැකි බව.	ව්‍යාපෘති/ මාර්ග මොනවාද යන්න සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(එ)	සමාලෝචිත වර්ෂය තුලදී සහා ප්‍රතිසංස්කරණ යටතේ මාර්ග ප්‍රතිසංස්කරණ සිදුකිරීම් සඳහා මුදලින් කළ ගෙවීම් ලෙස රු.90,998,630 ක් දක්වා තිබූ අතර රු.20,340,203 කට අදාල විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කිරීමට සභාව අපොහොසත් විය.	ඉදිරි අවසන් ගිණුමේදී නිවැරදි කරන බව.	විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උඩුගම්පොල පොදු වෙළඳපළෙහි උඩුමහලේ කඩ කාමර 06 ක් 2025 අප්‍රේල් 29වන විටත් බදු දීමකින් තොරව ඌණ උපයෝජිතව පැවතුණි. උඩුගම්පල කඩ කාමර බදු ගිවිස්නාවෙහි කොන්දේසි අංක 07 ප්‍රකාරව දේපළ අතුරු බදු දීම හෝ කුලියට දීම හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම හෝ අන්සතු කිරීම සිදු කළ නොහැකි වුවත් කඩකාමර අංක 1,3 සහ 5 සඳහා සභාවට ලැබෙන බදු ආදායම රු.9,000 ක් වුවද, එකතු වටිනාකම රු.41,000 ක මුදලකට බාහිර පාර්ශවයන්ට කුලියට ලබා දී තිබුණි.	අතුරු බදු දීම් සම්බන්ධව පරීක්ෂා කර සුදුසු පියවරක් ගැනීමට කටයුතු කරන බව.	සභාව සතු දේපල අතුරු බදු දීම් සම්බන්ධව පසු විපරම් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	මාබොදල උප කාර්යාලයට අයත් කඩ කාමර 07 ක් සහ මිනුවන්ගොඩ කඩ කාමර 01 සිට 05 දක්වා වූ කඩ බදු දීමට අදාල ලිපිගොනු සභාව සතුව නොපැවතීම හේතුවෙන් මෙම කඩකාමර වලට අදාල ගිවිසුම් හා අදාළ අනෙකුත් ලියවිලි නොපවතින බැවින් කඩකුලී අයකර ගැනීමට කිසිඳු නීත්‍යානුකුල පියවරක් ගැනීමට නොහැකි වී තිබුණි.	මෙම කඩ කාමරවලට අයත් මුල් ලිපිගොණු සොයාගත නොහැකි අතර නව ලිපි ගොණු සකස් කිරීමට කටයුතු කරමින් පවතින බව.	බදු දීමට අදාළ ලිපිගොනු සම්බන්ධයෙන් කඩිනමින් අදාල කටයුතු කර බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	නව කඩ කාමර අංක 2,5,6,7 සහ 8 සඳහා බදු ගැණුම්කරුවන් කිසිවකු කඩකාමර සඳහා ගිවිසුම් ගතවීමට ඉදිරිපත් වී නොතිබුණු අතර ඉන් කඩ කාමර අංක 5,7 සහ 8 බදු ගිවිසුම් අත්සන් නොකර බාහිර පාර්ශවයන්ට කුලියට ලබාදී තිබුණි.	විධිමත් පරිදි ගිවිසුම් ගත වීමට කටයුතු කර ඇති බව.	කඩ කාමර බදු දීමේදී ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුය.
(ඈ)	වරිපනම් දේපල වර්ෂ 5කට වරක් තක්සේරු කරනු ලැබිය යුතු වුවද උඩුගම්පල, පත්තඩුවන හා මාබෝදල උපකාර්යාලවල දේපල 2017 වර්ෂයේදී සිදුකරනු ලැබූ වටිනාකම් මත වරිපනම් බදු අයකර තිබූ අතර ඉන් ග්‍රාම නිලධාරි වසම් 39 ක් සහිත මාබොදල උපකාර්යාල බල ප්‍රදේශයට අයත් ප්‍රධාන මාර්ග 05 හි මිටර් 100 ක් දුරට පමණක්ද ග්‍රාම නිලධාරි වසම් 38 සහිත පත්තඩුවන උපකාර්යාල බල ප්‍රදේශය තුල පිහිටි ප්‍රධාන මාර්ග 09 හි මීටර් 100 ක් දුරට පමණක්ද වරිපනම් තක්සේරුකර තිබුණි. බල ප්‍රදේශය වැඩිකර නොගැනීම නිසා සහ තක්සේරුව ප්‍රමාදවීම නිසා සභාවට අයවිය යුතුව තිබූ වරිපනම් ආදායම් අහිමි වී තිබුණි.	ඉදිරියේදී හැකි ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව.	වරිපනම් බල ප්‍රදේශය වැඩිකර තක්සේරු කඩිනමින් සිදුකර වරිපනම් ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ඉදිකිරීම් පිළිබඳව විස්තර ඇතුලත් කරමින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.	සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව සැලැස්ම සකස් කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 ජනවාරි 12 දිනැති අංක DMA/01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 01 ඡේදය ප්‍රකාරව, ජාතික විගණන පනතේ අංක 40(3) වගන්තිය හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 134(1) මගින් අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය නිශ්චය කර ඇති අතර අභ්‍යන්තර විගණනය බලපෑම් හෝ කොන්දේසිවලින් තොරව විගණකවරුන්ට අපක්ෂපාතී මධ්‍යස්ථ විනිශ්චයන් ලබා දීම සඳහා අවශ්‍යවන විධිමත් කාර්යානුබද්ධ පැවැත්මක් තිබිය යුතු වුවද සභාවේ 2024 වර්ෂයේ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන කමිටුව සඳහා සභාව විසින් අභ්‍යන්තර විගණන නිලධාරී පත්කිරීම හේතුවෙන් ඉහත පරිදි අපක්ෂපාතී වාර්තාකරණයට හා ස්වාධීනත්වයට බාධා වී තිබුණි.	පුරප්පාඩු පවතින බැවින් ප්‍රත්‍යාගණන කමිටුව සඳහා යෙදවිය හැකි වෙනත් නිලධාරියකු නොවූ බව.	අභ්‍යන්තර විගණන නිළධාරීට ස්වාධීනව කටයුතු කිරීමට අවස්ථාව සලසාදිය යුතුය.